**රත්මලාන / මොරටුව සහ ජාඇල/ ඒකල අප ජලය අපහරණය කිරීමේ ව්‍යාපෘතිය - 2016**

---

රත්මලාන / මොරටුව සහ ජාඇල/ ඒකල අප ජලය අපහරණය කිරීමේ ව්‍යාපෘතියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා රජය හා ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන සහයෝගීතා නියෝජිතායතනය (SIDCA) අතර 2006 මාර්තු 02 දින එළඹි අංක 71001436 දරන නිශ්චිත ගිවිසුමේ 11 වාවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ නිශ්චිත ගිවිසුම අනුව, එවකට ජාතික ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වන්නේ මධ්‍යම පිරිසිදු කිරීමේ පිරියතයන්ට කර්මාන්ත හා ගෘහස්ථ අප ජලය සුදුසු පරිදි එකතු කිරීමක් සහිතව පරිසරයට හෝ ජනතාවට හානිකර නොවන ආකාරයකින් පාවිච්චි කරන ලද අප ජලය හා ඝන මඩ ජලය අපහරණය කිරීම සමඟ රත්මලාන/ මොරටුව හා ජාඇල/ ඒකල යන ප්‍රදේශ දෙකෙහි පරිසර දූෂණය කළමනාකරණය කිරීම තහවුරු කර ගැනීමයි. ව්‍යාපෘතියේ දිගුකාලීන සමස්ත අරමුණු වන්නේ ප්‍රදේශයේ ජනතාව සඳහා සෞඛ්‍ය හා ජීවන තත්ත්වයන් වැඩිදියුණු කිරීම, සංවේදී ජෛව පද්ධතිවල පාරිසරික තත්ත්වයන් වැඩිදියුණු කිරීම සඳහා දායකවීම සහ රත්මලාන/ මොරටුව හා ජාඇල / ඒකල ප්‍රදේශවල මලාපවහන ජාලයන් හා පිරිසිදු කිරීමේ පහසුකම් සැපයීම මඟින් කොළඹ අවට කර්මාන්ත ප්‍රදේශවල තිරසාර සංවර්ධනයක් ස්ථාපිත කිරීමයි. නිශ්චිත ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 12,135 කට සමාන එජඩො මිලියන 120.02 ක් වන අතර රු.මිලියන 9,058 කට සමාන එජඩො මිලියන 91.92 ක් ණයක් වශයෙන් හා රු.මිලියන 474 කට සමාන එජඩො මිලියන 4.14 ක් ප්‍රදානයක් වශයෙන් මූල්‍යයනය කිරීමට ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන සහයෝගීතා නියෝජිතායතනය එකඟවී තිබුණි. ඉතිරි ශේෂය වූ එජඩො. මිලියන23.96 ට සමාන රු. මිලියන 26.03 ක් මූල්‍යනය කිරීමට ශ්‍රී ලංකා රජය එකඟ වී තිබුණි. පසුව ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු.මිලියන 17,471 කට සමාන එජඩො මිලියන 148.91 දක්වා සංශෝධනය කර තිබූ අතර ඉන් රු.මිලියන 11,315 කට සමාන එජඩො මිලියන 95.06 ක් ණයක් වශයෙන් හා රු.මිලියන 1,034 කට සමාන එජඩො මිලියන 8.99 ක් ප්‍රදානයක් වශයෙන් මූල්‍යයනය කිරීමට ස්වීඩන් ජාත්‍යන්තර සංවර්ධන සහයෝගිතා නියෝජිතායතනය විසින් එකඟවී තිබුණි. රු. මිලියන 5,122 කට සමාන ඉතිරි මුදල වන එජඩො මිලියන 44.86 ක මුදල ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කළ යුතුය. ව්‍යාපෘතිය එහි කටයුතු 2008 පෙබරවාරි 01 දින ආරම්භ කර තිබුණු අතර 2013 ජුනි 30 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘතියේ කාලය 2016 ජුනි 30 දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේ වුවද 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය සහ ප්‍රදාන වලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය සහ ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ණය සහ ප්‍රදාන ගිවිසුම් වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම හැර මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) නිශ්චිත ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) නිශ්චිත ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතුව රු. මිලියන 299.58 ක් වූ ඍජු ගෙවීම්, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්තාගත කර තිබූ එකතුව රු. මිලියන 306.84 ක් වූ ඍජු ගෙවීම් සමග එකඟ වී නොතිබුණි.

(ආ) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට භාරදෙන ලද ස්ථාවර වත්කම් පිළිබඳ අවශ්‍ය ගිණුම්කරණ ගැලපීම් ලෙජර ගිණුම්වල කර නොතිබූ බව නිරීක්ෂණය විය. එබැවින් ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට භාර දෙන ලද රු. මිලියන 3.06 ක් වූ මෝටර් රථයේ වටිනාකම පිරියත දේපල හා උපකරණ වටිනාකමින් අඩු කිරීම වෙනුවට කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ වලින් අඩු කොට දක්වා තිබුණි.

### 2.2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

-----------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 6.1(අ) වන වගන්තිය ප්‍රකාරව වටිනාකම රු.මිලියන 5 හෝ ඊට වැඩි කොන්ත්‍රාත් භාර ගනු ලබන කොන්ත්‍රාත්කරුවන් පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් යටතේ ලියාපදිංචි විය යුතුය. එසේම ටෙන්ඩරය පිරිනැමීමෙන් පසු දින 60 ක් ඇතුළත ටෙන්ඩර් ගිවිසුම පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි කළ යුතුය. කෙසේ වුවද ව්‍යාපෘතියේ කටයුතු කරන කොන්ත්‍රාත්කරුවන් තිදෙනකු ඉහත සඳහන් අවශ්‍යතාවයන් වලට අනුකූල වී නොතිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 5.4.12 වගන්තිය, 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 21 වන වගන්තිය හා 2002 සැප්තැම්බර් 30 දිනැති අංක 364 (3) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5 ඡේදයට අනුව, එකතු කළ අගය මත බදු ගෙවීම් මාසික වාර්තා විගණකාධිපතිට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ව්‍යාපෘතිය විසින් ඉදිරිපත් කර නොතිබුණි. 2016 දෙසැම්බර් 31 දක්වා ගෙවා තිබූ එකතු කළ අගය මත බදු එකතුව රු. මිලියන 1,448.32 ක වටිනාකමක් විය.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

----------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

------------------------

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2016 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූලායනය සඳහා එකඟවූ මුදල | | | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආරම්භක වෙන්කිරීම | | සංශෝධිත වෙන්කිරීම | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2016 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ස්වීඩන ජාත්‍යන්තර සංවර්ධන සහයෝගීතා නියෝජිතායනය | | | | | | | | | |
| - ණය | 91.92 | 9,058 | 95.06 | 11,315 | 250 | 2.21 | 321.29 | 92.49 | 10,790.13 |
| - ප්‍රදාන | 4.14 | 474 | 8.99 | 1,034 | 16 | 0.06 | 9.67 | 8.20 | 978.79 |
| ශ්‍රීලංරජ | 23.96 | 2,603 | 44.86 | 5,122 | 210 | 0.85 | 123.94 | 29.58 | 3,873.56 |
| එකතුව | 120.02 | 12,135 | 148.91 | 17,471 | 476 | 3.12 | 454.90 | 130.27 | 15,642.48 |

### 3.2 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතිය විසින් ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තා අනුව, ජාඇල/ඒකල අප ජලය පිරිසිදු කිරීමේ පිරියත ඉදිකිරීමේ කාර්යය හා නළ එලීමේ කාර්යයන් 2012 දෙසැම්බර් 31 දිනට අවසන් කර තිබුණි. මොරටුව / රත්මලාන අප ජලය පිරිසිදු කිරීමේ පිරියත ගොඩනැංවීමේ කාර්යය 2015 දෙසැම්බර් 31 දින වන විට සම්පූර්ණ කර තිබුණද කි.මී. 4.5 ක ප්‍රදේශයක නළ එළීමේ කාර්යය 2016 දෙසැම්බර් 31 වන විටද සම්පූර්ණ කර නොතිබුණි. ලද තොරතුරු අනුව නළ එළීමේ කාර්යයේ ඉතිරි වැඩ කොටස ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ නිම කිරීමට තීරණය කර තිබුණි.

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

2008 වර්ෂයේදී ප්‍රදානය කරන ලද රත්මලාන / මොරටුව ප්‍රදේශයේ අප ජලය අපහරණ පද්ධතිය පිළිබඳ කොන්ත්‍රාත්තුව, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාල පරිච්ඡේදය තුළදී කොන්ත්‍රාත්කරු බුන්වත්වීම හේතුකොට ගෙන ව්‍යාපෘතිය විසින් 2013 වර්ෂයේදී අවසන් කර තිබුණි. කෙසේ වුවද, කොන්ත්‍රාත්කරු තබන ලද එජඩො මිලියන 9.06 ක් වූ කාර්ය සාධන බැඳුම්කරයෙන් හා එජඩො මිලියන 7.96 ක් වූ ඇපකරයෙන් එජඩො මිලියන 10.50 ක් අය කරගැනීමට ව්‍යාපෘතියට හැකිවී තිබුණි. මෙයට අමතරව කොන්ත්‍රාත්කරුට ගෙවන ලද වැඩිපුර ගෙවීම් එජඩො මිලියන 6.74 ක් අයකර ගැනීමට ව්‍යාපෘතිය කටයුතු කර නොතිබුණි.

**3.4** **පරිබාහිර ගනුදෙනු**

**-------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ අරමුණුවලට සෘජුවම අදාළ නොවන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සේවකයන්ට සොයිසාපුර නිල නිවාස ඉදිකිරීම වෙනුවෙන් ව්‍යාපෘතිය විසින් රු.මිලියන 123.84 ක මුදලක් වැය කර තිබුණි.

(ආ) ව්‍යාපෘතියේ අරමුණු වලට අදාළ නොවන ව්‍යාපෘතියේ දෙවන අදියර සඳහා ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් ව්‍යාපෘතිය විසින් රු. මිලියන 1.40 ක මුදලක් වැය කර තිබුණි.

**3.5** **මතභේදයට තුඩුදෙන කරුණු**

**------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නිශ්චිත ගිවිසුමේ I ව්‍යවස්ථාව ප්‍රකාරව පාවිච්චි කරන ලද ජලය හා ඝන මඩ ජලය මොරටුව/රත්මලාන හා ජාඇල / ඒකල අප ජලය පාලන පිරිසිදු කිරීමේ පිරියතවල ජීවීන්ට සහ පරිසරයට හානි නොවන ආකාරයකින් අපහරණය කළ යුතුය. වියළි මඩ කළමනාකරණය සඳහා අඛන්ඩ පදනමක් මත පර්යේෂණ ක්‍රමවේදයක් යොදාගැනීමට අනුමැතිය ලබා දී තිබුණද ඒ සඳහා යෝග්‍ය යාන්ත්‍රණයක් හඳුන්වා දීමට ක්‍රියා කර නොතිබුණි.

(ආ) 2009, 2010 සහ 2011 වර්ෂයන්හිදී මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් ලබාගන්නා ලද එකතුව රු. මිලියන 20.82 ක වටිනාකමකින් යුත් බැංකු ඇපකර 10 ක්, අදාළ කාර්යය සම්පූර්ණ කර නියමිත අධිකාරියන්ට භාරදී තිබුණද 2016 අප්‍රේල් 30 වන විටත් මුදාහැරීමට කටයුතු කර නොතිබුණි.තවද 2012 හා 2013 වර්ෂයන්හිදී මාර්ග ප්‍රතිසංස්කරණ කාර්යය සඳහා මාර්ග සංවර්ධන අධිකාරයේ තැන්පත් කරන ලද එකතුව රු. මිලියන 12.98 ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පතු 05 එම කොන්ත්‍රාත්වල ඇප කාල සීමාව ඉකුත් වී තිබුණද අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.6** **ව්‍යාපෘතියේ කාර්යය නිම කිරීම**

**------------------------------------**

ව්‍යාපෘති කාර්ය 2016 ජුනි 30 දින වන විට අවසන් වී තිබුණ ද ව්‍යාපෘතියේ වත්කම් හා වගකීම් පවරා දීමට හා ඇවර කිරීමේ අරමුණ වෙනුවෙන් මුලා ප්‍රකාශන පිළියෙල කිරීමට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය කටයුතු කර නොතිබුණි.